## ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (එස්ඊයූඩීපී) - අදියර 1 බී-2012

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාස තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

#### 2.1 මූල්‍ය කාර්යය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, උපදේශක ගාස්තු වලට (දේශීය) අදාලව පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.9,779,360 ක් විය.

### 3. විගණන නිරීක්ෂණ

#### ව්‍යාපෘති කාලපරිච්ඡේදය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය 2012 මාර්තු 19 දින ආරම්භකර 2014 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවුවද ව්‍යාපෘති කටයුතු ආරම්භකර තිබුණේ 2012 සැප්තැම්බර් 01 දිනදීය.

4. <u>අරමුදල් උපයෝජනය</u>

2012 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවට අනුව, වැය ශීර්ෂ 171, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රු.275,400,000 ක ප්‍රතිපාදනයක් මෙම ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණි. ප්‍රතිපාදනය, ඒ මත දරන ලද තථ්‍ය වියදම, අරමුදල් ඌන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂ විස්තරය | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදන | 2012 වර්ෂය සඳහා තථ්‍ය වියදම | ඌන උපයෝජනය | |
|---|---|---|---|---|
| | | | මුදල | ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | රු. | % |
| විදේශාධාර - ණය | 13,500,000 | නැත | 13,500,000 | 100 |
| ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර - ණය | 224,000,000 | 9,779,360 | 214,220,640 | 96 |
| විදේශාධාරවලට අදාල දේශිය අරමුදල් | 37,900,000 | නැත | 37,900,000 | 100 |
| | 275,400,000 | 9,779,360 | 265,620,640 | 96 |